# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1157/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 14/07/2024 පැය 1040

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු හා හෙරොයින් ජාවාරමට සැකපිට පුද්ගලයෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.07.13 වන දින රාත්‍රී කාලයේ වැලිගම පොලිස් වසමේ සේනානායක ක්‍රීඩාංගනය අසලදී පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 445ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු ත්‍රීරෝද රථයක්, ජංගම දුරකතනයක් හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් රුපියල් ලක්ෂ 05ක් සමඟ, මත්ද්‍රව්‍ය ජාවරමට සැකපිට පුද්ගලයෙකුද අත්අඩංගුවට ගෙන වැලිගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30 හා 54 යන වයස්වල පසුවන රත්මලාන හා වැලිගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.** වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2024.07.13 වන දින දහවල් කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගලේවෙල පොලිස් වසමේ වලව්වල ප්‍රදේශයේදී විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් හා පතරොම් 05ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගලේවෙල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන පත්කොළගොල්ල, ගලේවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** ගලේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **වරෙන්තු නිකුත්වී සිටි සැකකරුවෙකු මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර.**

2024.07.13 වන දින සවස් කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඕමන්ත පොලිස් වසමේ පනික්කන්රාවි ප්‍රදේශයේදී වව්නියාව මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩු 05ක් සඳහා වරෙන්තු නිකුත් වී සිටි සැකකරුවෙකු මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ අත්අඩංගුවට ගෙන ඕමන්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන පූන්තොට්ටම්, වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** ඕමන්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුර.**

2024.07.13 වන දින දහවල් කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඉලුප්පුකඩවායි පොලිස් වසමේ මුදලිආරු හා අන්තෝනියාපුරම් ප්‍රදේශවලදී මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඉලුප්පුකඩවායි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 හා 40 යන වයස්වල පසුවන ඉලුප්පුකඩවායි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** ඉලුප්පුකඩවායි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**